ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2024
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1හි 88 ඡේදය ප්‍රකාරව නව ආයුර්වේද නිෂ්පාදන 10ක් විවෘත වෙළඳපලට හඳුන්වාදීමේ හා ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල විසින් 2015 මැයි 26 දින සංස්ථාවට ලබා දී තිබුණු රු.15,000,000 ක ප්‍රදානය ආදායමක් ලෙස ගිණුම්ගත නොකර ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණු අතර ප්‍රතිපත්තිමය එකඟතාවයක් මත 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා අලෙවිකරන අදාළ නිෂ්පාදන 10 හි එක් එක් ඒකකයක ලාභයෙන් සියයට 10 බැගින් අරමුදලට ගෙවූ රු.3,266,586 ක මුදල එක් එක් වර්ෂයේ වියදමක් ලෙස නොදක්වා ජංගම වගකීම් ගිණුමට හර කර තිබුණි. සමාලෝචිත වර්ෂයේද එම වරද නිවැරැදි කිරීමට කටයුතු කර නොතිබුණි.	සෞඛ්‍ය සංවර්ධන අරමුදල මගින් ලබාදී ඇති රු.මිලියන 15ක මුදල ප්‍රදානයක් ලෙස සලකා ආදායමක් ලෙස ගිණුම් ගත කරන ලෙස විගණනය විසින් පෙන්වා දී තිබුණද, එය ප්‍රදානයක් බවට කිසිදු ලේඛනයක සඳහන් නොවන බව, මෙම මුදල සම්බන්ධයෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලෙන් තවදුරටත් විමසීම් සිදුකර කළමනාකාරීත්වයේ අනුමැතිය පරිදි ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව.	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි සඳහන් නියමයන්ට අනුකූලව පහත සඳහන් කරුණු ඉටුකර නොතිබුණි.		
	(i) ප්‍රමිතියේ 36 ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණනය කරන අවස්ථාවේදී අදාළ වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත්, 2022 වර්ෂයේ පිරිවැය රු.41,010,767 ක්වූ වාහන 27කින් පිරිවැය රු.37,573,800 ක්වූ වාහන 18 ක්	අප ආයතනයට අයත් මෝටර් රථ වාහන කොටසක් ආයතන පරිශ්‍රයෙන් බැහැරව පැවතීම හා අනෙකුත් හේතූන් නිසා කලමනාකරණයේ තීරණය මත ප්‍රත්‍යාගණනය සිදු කර නොමැති	-එම-

	පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. ඒ අනුව ප්‍රත්‍යාගණනය නොකරන ලද මෝටර් රථ 09ට අදාළ ක්ෂය වෙන්කිරීම් රු.2,528,501ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කිරීම හේතුවෙන් ක්ෂය වෙන් කිරීම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ගිණුම්ගතකර තිබුණි. සමාලෝචිත වර්ෂයේද එම වරද නිවැරැදි කිරීමට කටයුතු කර නොතිබුණි.	බව, එසේ වුවත් එම මෝටර් රථ වාහන කළමනාකාරීත්වයේ අනුමැතිය යටතේ 2022 ජනවාරි 01 දිනට පිරිවැය තක්සේරු අගය ලෙස සලකා ගිණුම්ගත කර ඇති බව, එම නිසා ප්‍රත්‍යාගණනය නොකරන ලද නමුත් පිරිවැයට ගිණුම්ගත කර ඇති මෝටර් රථ 09 ට අදාළ ක්ෂය වෙන් කිරීම් රු.2,528,501 වටිනාකම ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට මාරු කිරීම නිවැරදි බව.	
(ii)	සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.104,167,093 වූ යන්ත්‍රෝපකරණ, ජල සැපයුම් යන්ත්‍ර, රසායනාගාර උපකරණ හා ඉන්වෙන්ට්‍රි අයිතම 462 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් තිබුණද, ප්‍රමිතියේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ඇස්තමේන්තුගත දෝෂ හඳුනා ගෙන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධන කිරීමට කටයුතු කර නොතිබුණි.	ආයතනයේ භාවිතා කරනු ලබන මෙම යන්ත්‍ර උපකරණ ඉදිරියේදී අගය කිරීමේදී දැරිය යුතු පිරිවැයද සැලකිල්ලට ගනිමින් මෙම යන්ත්‍ර උපකරනවල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සම්බන්ධ නැවත සමාලෝචනයක් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව.	-එම-
(iii)	2015 වර්ෂයේදී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන තිබුණු පිරිවැය රු.20,980,575ක්වූ යන්ත්‍රෝපකරණ 09ක් සංස්ථාවට බාරදී තිබුණද, එම යන්ත්‍රෝපකරණ තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. එම යන්ත්‍රෝපකරණ 09 න් සංස්ථා පරිශ්‍රයෙහි යන්ත්‍ර 05ක් පමණක් පැවතුණ බවත් ඉන් Pharmaceutical Grade Ro Water System යන්ත්‍රය පමණක් භාවිතයට ගනු ලබන අතර විගණිත දිනය වූ 2025 ජුනි 12 දක්වා යන්ත්‍ර 04ක් නිශ්කාර්යව තිබුණි.	බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනය විසින් මිලදී ගෙන තිබූ, එම ආයතනය භාවිතයට නොගන්නා යන්ත්‍ර 09 ක් 2024 ජුනි 18 දින මෙම සංස්ථාව වෙත ලබාදෙන ලද බව, එම යන්ත්‍ර වලින් යන්ත්‍ර 05ක් මේවන විට සංස්ථා නිෂ්පාදනාගාරය වෙත ගෙනවිත් ඇති අතර යන්ත්‍ර 04ක් තවදුරටත් එම ආයතනයේ පවතින බව, එම සියලුම යන්ත්‍ර ගිණුම්ගත කිරීමට පියවර ගනු ලබන බව.	මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා යන්ත්‍රෝපකරණ තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.
(iv)	ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංස්ථාව විසින් උපයෝජනය කරන හෙක්ටයාර 0.773ක්වූ භූමිය දක්වා තිබියදි සංස්ථාව විසින් එහි අයිතිය පවරා ගැනීමකින් තොරව 2017 වර්ෂයේදී රු.366,000,000කට ඉඩම තක්සේරු කර	ඉහල කළමනාකාරීත්වයේ අනුමැතිය ලබා ගෙන 2025 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙන් ලියා හැරීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.		
(v)	ප්‍රමිතියේ 55 ඡේදයට පටහැනිව සංස්ථාව විසින් විදුලි ජනන යන්ත්‍රය ප්‍රධාන පරිපථයට සම්බන්ධ කිරීමට අවශ්‍ය උපකරණ මිලදී නොගැනීම හේතුවෙන් යන්ත්‍රය භාවිතයට ගත නොහැකි තත්ත්වයේ තිබියදී ක්ෂය ලෙස රු.803,628ක් ගලපා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන්කිරීම එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේදී අදාළ නිවැරදි කිරීම් සිදු කරනු ලබන බව.	-එම-
(vi)	හෙක්ටයාර 2.2 ක්වූ මැදවච්චිය ඔසු උයන, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් විසින් සංස්ථාව වෙත 2022 වර්ෂයේදී පැවරීම සිදු කර තිබුණද, එම ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂයේදීද ගෙන නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 04 දේපළ පිරියත හා උපකරණ යටතේ භාවිතය සම්බන්ධයෙන් හෙළිදරව් කර ඇති බව, මෙම ඉඩම සංස්ථාව වෙත පවරා ඇති බැවින් ඉදිරි වර්ෂයේදී නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව.	මූල්‍ය තොරතුරුවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා ඉඩම තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 හි 04 ඡේදය ප්‍රකාරව සංස්ථාවේ ස්ථාපිත කර තිබුණු ERP පරිගණක මෘදුකාංග පද්ධතිය සඳහා ගෙවිය යුතු රු.30,000,000 ක මුදල අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ අතර වගකීම්ද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. ප්‍රමිතියේ 8 ඡේදය ප්‍රකාරව ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය වටිනාකමවූ රු.1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මේවන විට මෘදුකාංග පද්ධතිය සකස්කර ඇති අතර ක්‍රියාත්මක කර නැති බව, පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු අදාළ පරිදි ගිණුම්ගත කිරීම් සිදු කිරීමට පියවර ගනු ලබන බව, ERP මෘදුකාංග පද්ධතිය සඳහා මෘදුකාංග සංවර්ධන සමාගම වෙත මේ දක්වා කිසිදු ගෙවීමක් සිදුකර නොමැති බව, අදාළ ගෙවීම් සිදුකිරීම පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව සිදුකරන අතර ඉන් පසු අදාළ ගිණුම්ගත කිරීම් සිදු කිරීමට පියවර ගනු ලබන බව.	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගබඩා 05ක සහ දිවයින පුරා පිහිටි ඖෂධ අලෙවිසැල් 16 ක පැවැති නිමි තොග ලෙජරවල ඒකක මිල හා වටිනාකම් තීරු යාවත්කාලීන කර නොතිබුණි. ප්‍රමිතියේ 27 හා 28 ඡේද ප්‍රකාරව ඉතිරි තොගවල පිරිවැය අගය ශුද්ධ උපලබ්ධි	නව පරිගණක පැකේජය ස්ථාපිත කිරීමෙන් පසු තොග ලෙජරය ඒකක මිල සහ වටිනාකම සහිතව පවත්වා ගත හැකි බව, තවද සංස්ථාවේ සියලු අලෙවි මධ්‍යස්ථාන ජාල ගත කරමින්	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර පරිගණක නොමැති අංශවල තොග ලෙජර පොත් පවත්වා

	අගය සමඟ සසඳා ඉන් අඩු අගය වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශන සඳහා යොදා ගැනීම වෙනුවට නිෂ්පාදිත වර්ෂයේ නිෂ්පාදන පිරිවැය මත 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ අගය රු.262,641,057ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි.	නව පරිගණක පැකේජයක් හඳුන්වාදීම සඳහා මේ වන විට මූලික ක්‍රියමාර්ග ගනිමින් පවතින බව.	ගැනීමට කටයුතු කල යුතුය.
(ආ)	2024 වාර්ෂික තොග සමීක්ෂණයේදි එක් අලෙවි මධ්‍යස්ථානයක හා නිමි තොග ගබඩා 02 හි තොග සමීක්ෂණ වාර්තාවේ පොත් ඒකක ප්‍රමාණය සටහන් කර නොතිබුණු අතර සමීක්ෂණ මණ්ඩලය විසින් පිරිවැය රු.225,241,813ක්වූ තොග අයිතම් 460 කට අදාළව ඒකක 658,593ක ඌනතා හෝ අතිරික්තතා හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2024 වාර්ෂික තොග සමීක්ෂණයේදී ගාල්ල අලෙවි මධ්‍යස්ථානය තාවකාලිකව වසා දමා තිබීම, නිමි තොග ගබඩා දෙක (07 සහ 08 ගබඩාව) එක් ගබඩාවක් ලෙස එකතු කිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් තොගයේ පොත් ඒකක ප්‍රමාණය සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව, නමුත් 2024 දෙසැම්බර් 31 දිනට නිමි තොග අගය කිරීමේදී භෞතික තොගය පිරිවැයට ගණනය කර ඇති බව, තවද අලෙවි මධ්‍යස්ථානයට අදාළ තොග ඌනතා අතිරික්තතා වාර්තා පිළියෙල කර ඇති අතර නිමි තොග ගබඩාවට අදාළව තොග ඌනතා සහ අතිරික්තතා වාර්තා ඉදිරියේදී පිළියෙල කරනු ලබන බව.	ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	අලෙවිසැල් 15ක හා ගබඩා 02ක අවසන් නිමි ඖෂධ තොග වටිනාකම ගණනය කිරීමේදී තොග අයිතම් 45කට අදාළව පිරිවැය රු.3,502,295ක්වූ තොග ඒකක 18,189ක් ගණනය කර නොතිබූ අතර අලෙවිසැල් 03ක හා එක් ගබඩාවක අවසන් නිමි ඖෂධ තොග වටිනාකම ගණනය කිරීමේදී තොග අයිතම් 05කට අදාළව පිරිවැය රු.76,499ක්වූ තොග ඒකක 523ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් නිමි ඖෂධ තොග වටිනාකම රු.3,425,795ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.	මෙම අලෙවිසැල් 15ක සහ ගබඩා 02ක 2024 දෙසැම්බර් 31 දිනට නිමි ඖෂධ ගණනය කිරීමේදී මග හැරි තිබූ තොග වටිනාකම රු.3,502,295ක අගය සහ වැඩියෙන් ගණනය කර තිබූ රු.76,499 ක අගයෙහි ශුද්ධ බලපෑම වන රු.3,425,795ක වටිනාකම 2025 වර්ෂයේදී නිමි තොග වලට ගැලපීම් සිදු කරනු ලබන බව.	-එම-
(ඈ)	තොග හා සමීක්ෂණ වාර්තා අනුව භෞතිකව පැවති තොග ඒකක සැසඳීමේදී අලෙවි සැල් 09කට හා ගබඩා 02කට අදාළව රු.4,767,427ක් වටිනා නිමි තොග ඒකක 12,722ක ඌනතාවයක් හා අලෙවිසැල් 10කට හා ගබඩා 02 කට අදාළව රු.3,550,449ක් වටිනා නිමි තොග ඒකක 18,571ක අතිරික්තයක් තිබුණි.	තොග සමීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් ආයතනයේ සියලු අලෙවි මධ්‍යස්ථානවල සහ ගබඩාවල තොග ඌනතා සහ අතිරික්තතා වාර්තා ගිණුම් අංශය විසින් පිළියෙල කර ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබන බව.	-එම-

(ඉ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩාවල හා ඖෂධ අලෙවිසැල්වල පැවැති හානිවූ හා කල් ඉකුත්වූ තොග වෙනුවෙන් රු.14,908,104 ක් වෙන්කර තිබුණු නමුත් හානිවූ හා කල් ඉකුත් තොගයේ තථ්‍ය වටිනාකම රු.18,322,395ක් වූයෙන් ඌන වෙන් කිරීම රු.3,414,291 ක් වී තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට ගබඩාවල සහ අලෙවි මධ්‍යස්ථානවල පැවති හානි වූ හා කල් ඉකුත් වූ තොග සම්බන්ධ රු.3,414,291 ක ඌන වෙන් කිරීම 2025 වර්ෂයේදී ගිණුම් වලට ගලපනු ලබන බව.	-එම-
(ඊ)	සමාලෝචිත වර්ෂයේ අමුද්‍රව්‍ය ගබඩා 02කට හා ලිපිද්‍රව්‍ය ගබඩාවකට අදාළව තොග හා තොග සමීක්ෂණ වාර්තා අනුව භෞතිකව පැවති ඒකක ගණන සැසඳීමේදී අයිතම 137 කට අදාළව ඒකක 1,349ක ඌනතාවයක් පැවති අතර එහි වටිනාකම රු.1,605,816ක් විය. තවද අමුද්‍රව්‍ය ගබඩා 03ක, බෝතල් ගබඩාව හා ලිපිද්‍රවය ගබඩාවට අදාළව ඒකක 9,700ක අතිරික්තයක් වූ අතර එහි වටිනාකම රු.3,582,635ක් වී තිබුණි.	2024 වර්ෂයේ තොග සමීක්ෂණයට අදාළව ගබඩාවන් 07ක තොග ඌනතා සහ අතිරික්තතා වාර්තා ගිණුම් අංශය විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන බව.	-එම-
(උ)	බෝතල්, ඇසුරුම් හා ලිපිද්‍රව්‍ය ගබඩාවේ භාවිතයට ගත නොහැකි අයිතම 28කට අදාළ ඒකක 593,032ක් වූ අතර එහි වටිනාකමවූ රු.2,113,520 ක් ඇතුළත්ව තොග ගණනය කර තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මෙම ගබඩාවන්හි තොග ශේෂ වටිනාකම පරිගණක පැකේජයේ ඇතුළත් කර ඇති තොග වටිනාකම් පදනම් කර ගනිමින් ඇතුළත් කරනු ලබන බව.	-එම-
(ඌ)	ගබඩා අංක 01 හා 02 හි අයිතම 98කට අදාළව රු.1,284,812 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 1,236 ක ඌනතාවයක් වූ අතර අයිතම 126 කට අදාළව රු.2,696,108 ක් වටිනා අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 9,230 ක අතිරික්තයක් පැවතුණි. එසේම අවශ්‍යතාවයකින් තොරව මිලදී ගැනීම හා ගබඩාගත කිරීම හේතුවෙන් වෙනිවැල්ගැට කිලෝග්‍රෑම් 1,958 ක් භාවිතයට ගැනීමට නොහැකිව දිරාපත් වී තිබුණි.	විමසුම හා එකඟ වන බව, සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා පොලිසිය විසින් අත් අඩංගුවට ගෙන අධිකරණ නියෝග මත මෙම සංස්ථාව වෙත ලබා ගැනීමේදී ඖෂධ නිෂ්පාදනයට නුසුදුසු දිරාගිය කොටස් ද සහිතව ලබා ගැනීමට සිදු වන බව, එම භාවිතයට ගත නොහැකි තොග ඉවත් කරන තුරු ගබඩාවේ තබා ගැනීමට සිදු වන බව, එම ඉවත් කළ යුතු තොග පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගනු ලබන බව.	-එම-
(එ)	මහජන බැංකුවේ ශේෂ සනාථ ලිපිය ප්‍රකාරව 2015 සහ 2019 වර්ෂවල විවෘත කරන ලද ණයවර ලිපි ආන්තික ගිණුම් 03ක ශේෂ එකතුව රු.1,951,492ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.26,989,398ක් ලෙස රු.25,037,906ක් වැඩියෙන් දක්වා තිබුණි. 2022 වර්ෂයට පෙර සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම ඉදිරියට ගෙන එන එම ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	අමුද්‍රව්‍ය ආනයනයට අදාළ පියවීමේ ලිපි ලේඛන සැපයුම් අංශය විසින් ගිණුම් අංශයට ඉදිරිපත් කිරීමට කිරීමට කටයුතු කර නැති බව, අදාළ ලේඛන සැපයුම් අංශයෙන් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	වරද නිවැරදි කළ යුතු අතර ගිණුම් අංශයේ අධීක්ෂණ ක්‍රියාවලිය සමාලෝචනය කර විධිමත් කිරීමට කටයුතු කල යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.)	අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.)	වෙනස (රු.)	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආරක්ෂණ තැන්පතු	25,867,571	13,167,073	12,700,498	2023 වර්ෂයට පෙර ඇප තැන්පතු ශේෂයන් ඇප තැන්පතු ලේඛනයේ නොමැති බැවින් මෙවැනි වෙනසක් ඇති වී තිබෙන බව.	ගිණුම්ගත තොරතුරු හා කේවල ශේෂ ලැයිස්තු කාලීනව සැසඳුම් කිරීමේ පාලන ක්‍රම හඳුන්වා දීමට කටයුතු කල යුතුය.
(ආ)	ණයගැතියෝ	106,967,889	2,223,792	104,744,097	ණයගැතියන් 06 දෙනෙකු විසින් ගෙවීමට ශේෂයක් නොමැති බව පැවසීම ගැටළුකාරී බැවින් මෙම අයවිය යුතු ශේෂ පිළිබඳව ගැටළු නිරාකරණයකර ගැනීමට අලෙවි අංශය වෙත ඉදිරිපත් කර ඇති බව.	මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සමඟ කාල විශ්ලේෂණ ශේෂ සසඳා වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කල යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ග්‍රෑම් 772 ක රන් තහඩු 09ක තොග වටිනාකම	1,841,645	පැවත්ම තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි	2024 වර්ෂයේදී රත්‍රං සංචිතයෙන් පැවැත්ම තහවුරු කර ගැනිමට සිදු කර නොමැති බව.	පැවත්ම තහවුරු කර අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ණයවර ලිපි වලට අදාළ සියයට 10 ක රැඳවුම් මුදල්	1,894,902	උපලේඛන	මෙම ශේෂය වර්ෂ ගණනාවක සිට පැවත එන අතර මේ සම්බන්ධ විස්තරාත්මක තොරතුරු සැපයුම් අංශයෙන් ලබාගෙන අදාළ ගැලපීම් සිදු කරන බව.	අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	ටෙන්ඩර් ආරක්ෂිත තැන්පතු	25,867,571	උපලේඛන, තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ	2023 වර්ෂයේ සිට ටෙන්ඩර් ආරක්ෂිත තැන්පතු සම්බන්ධයෙන් ලේඛනයක් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන බව, මෙම ටෙන්ඩර් තැන්පත් සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු තවදුරටත් සොයා බලා ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	අදාළ උපලේඛන තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	ගෙවිය යුතු තැන්පතු	1,041,015	උපලේඛන, තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ	පිළිතුරු ඉදිරිපත් කර නැත.	අදාළ උපලේඛන තැන්පතු ලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.
(ඉ)	වර්ෂ 15 ක සිට නොවෙනස්ව පවතින ප්‍රාග්ධන සංචිත ශේෂය	1,923,741	තහවුරු කර ගැනීමට අදාළ ලියකියවිලි	මේ සම්බන්ධ තොරතුරු ගිණුම් අංශය සතුව නොපවතින බව, ඉදිරියේදී මෙම ශේෂය සම්බන්ධයෙන් ඉහල කළමනාකාරීත්වයේ උපදෙස් මත අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලබන බව.	2025 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ගෙවීම් වවුචර	11,082,007	ගෙවීම් වවුචර හා මූලාශ්‍ර ලේඛන	මෙම වවුචර්පත් සොයා ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන බව.	සියළුම ගෙවීම් වවුරචර පත් නොපමාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂ 05කටත් පෙර සිට හිඟව පැවති රු.2,510,687 ක්වූ ණය ගැති ශේෂ 17 ක් පදනම් කර ගනිමින් රු.2,507,072 ක ප්‍රමාණයක් අඩමාන ණය සඳහා වෙන් කර තිබුණු නමුත් එම ණයගැතිගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ණය අයකර ගැනීම සඳහා කටයුතු කරන ලෙස අදාළ වාර්තා මාසිකව අලෙවි අංශය වෙත යොමු කර ඇති බව, ඉදිරියේදී අයකර ගත නොහැකි ශේෂ සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා කටයුතු කරනු ලබන බව.	ණයගැතියගෙන් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 අත්තිකාරම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබාගැනීමට විවිධ ආයතන වෙත ගෙවිය යුතු මුළු මුදලම අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර චෙක්පත් නිකුත් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් අදාළ භාණ්ඩ සංස්ථාව වෙත ලැබී තිබුණද ඊට අදාළ අත්තිකරම් නොපියවීම හේතුවෙන් අත්තිකාරම් ගිණුමේ රු.14,174,725 ක ශේෂයක් පැවතුණි. මෙම ශේෂය තුළ 2024 ජනවාරි 01 දින වන විට නොපියවන ලද රු.8,362,165 ක ශේෂයක්ද ඇතුළත් විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ ණයහිමි හා සාමාන්‍ය වියදම් අත්තිකාරම් පිළිවෙලින් රු.8,362,165ක් හා රු.14,174,725 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට පැවැති පොදු වියදම් අත්තිකාරම් රු.14,174,725 ක ශේෂය තුළ 2024 වර්ෂයේදී චෙක් අත්තිකාරම් ලබා ගත්තද 2024 වර්ෂය අවසාන වන විටත් භාණ්ඩ මිලදී නොගත් අවස්ථාවන් නිසා එකතු වූ අගයන්ද තිබිය හැකි බව, එම නිසා නිශ්චිත වශයෙන් පොදු වියදම් අත්තිකාරම් ශේෂ අගයන්ම ණයහිමියන් සහ පොදු වියදම් අත්තිකාරම් වැඩියෙන් දක්වා ඇති බවට කිව නොහැකි බව.	ලුහුකම් ක්‍රියාවලිය හරහා නිවැරදිව ගිණුම් තැබීමට පාලන ක්‍රම හඳුන්වා දිය යුතුය.
(ආ)	තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගත් මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්ය නිමකළ විගසම හෝ කාර්ය නිමකර දින 10ක් තුළ අග්‍රිමය පියවිය යුතු නමුත් නිලධාරින් 26 දෙනෙකු ලබාගෙන තිබුණු එකතුව රු.1,014950ක්වූ තත්කාර්ය අග්‍රිම 40ක් ආපසු පියවීම සඳහා කාර්යය නිමකර දින 10 ඉක්මවා දින 10 සිට දින 96ක් අතර කාලපරාසයක් ප්‍රමාද වී තිබුණි.	ප්‍රායෝගික කරුණු මත අප ආයතනයේ තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගත් දිනයේ සිට මසක කාලයක් තුළ පියවීම් සිදු කළ යුතු බව, එසේ මාසයක කාලයක් ඉක්මවූ අතුරු අග්‍රිමයන් සම්බන්ධයෙන් අත්තිකාරම් ලබා ගත් නිලධාරීන් ලිඛිතව දැනුවත් කරන අතරම තවදුරටත් නොපියවූ අත්තිකාරම් සියයට 10 ක අධිභාරයක් සහිතව වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලබන බව,නොපියවූ මුදල් අත්තිකාරම් අය කර ගැනීමේ ලේඛන නිකුත් කර මෙම අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇති බව, තවද මෙම අත්තිකරම් සියල්ලම 2025 වර්ෂයේදී පියවා ඇති බව.	මුදල් රෙගුලාසි හා අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.3 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂක විසින් කළමනාකාර තනතුර 02ක් සඳහා ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් දෙදෙනෙකුට, ඔහුට අයත් සමාගම් දෙකක සේවය කළ බවට ව්‍යාජ සේවා සහතික ලබා දී තිබුණු අතර අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයකු වශයෙන්ද කටයුතු කර අදාළ තීරණ ගැනීම සඳහාවූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද සහභාගී වී අවශ්‍ය සේවා පළපුරුද්ද නොමැති මෙම අයදුම්කරුවන් තෝරා ගැනීමට කටයුතු කර තිබුණි.	විගණන වාර්තාව හා එකඟ වන බව, මෙම සංස්ථාවේ විගණන හා කළමනාකරන කමිටුව වෙත විගණන විමසුම ඉදිරිපත් කර එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ඉහත තනතුරුවලට බඳවාගත් නිලධාරීන් දෙදෙනාගේ සේවය අවසන් කිරීමටත් ඔවුන් කූට/ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීමට එරෙහිව නුගේගොඩ විශේෂ අපරාධ විමර්ෂණ කාර්යංශයේ පැමිණිලි කිරීමටත් පියවර ගන්නා ලද බව, එමෙන්ම හිටපු කළමනාකාර අධ්‍යක්ෂ පී.එල්.ජී.එස් කාංචන මහතාට අයත් සමාගමකින් ව්‍යාජ සහතික නිකුත් කිරීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කටයුතු කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කිරීම තුළින් ළබැදියාවන් අතර ගැටුමක් පවතින බැවින් විගණන කමිටු නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ පැමිණිලි කිරීමට ද කටයුතු කරන ලද බව.	ආයතනික පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර විශේෂ අපරාධ විමර්ෂණ කාර්යංශයේ පරීක්ෂන කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිය යුතුය.
(ආ)	සංස්ථාවේ සැපයුම්කරුවෙකුවූ සමාගමක් සහ සංස්ථාවේ හිටපු කළමනාකාර අධ්‍යක්ෂකවරයා අතර සම්බන්ධිත පාර්ශව ගැටුමක් (Conflict of Interest) පවතින බව තහවුරු විය. නාමික සමාගමක් වූ මෙම සමාගමේ නම භාවිතා කර සංස්ථාව වෙත ප්ලාස්ටික් බෝතල් ලබාදීමට දූස්සන්ධානයෙන් යුක්තව කටයුතු කර තිබුණි. සංස්ථාව මෙම නාමික සමාගමෙන් 2023 හා 2024 වර්ෂයන්හි පිළිවෙලින් රු.10,891,681ක හා රු.23,227,843 ක ද්‍රව්‍ය මිලදීගෙන තිබුණි. සංස්ථාවට ප්ලාස්ටික් බෝතල්	විගණන වාර්තාව හා එකඟ වන බව, මෙම සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවකු වන සිලෝන් නේචර් ආයුර්වේද (පුද්ගලික) සමාගම හා හිටපු කළමනාකාර අධ්‍යක්ෂ පී.එල්.ජී.එස් කාංචන මහතා අතර සම්බන්ධතා පාර්ශව ගැටුමක් (Conflict of Interest) පවතින බවත් විගණන විමසුම විගණන හා කළමනාකරන කමිටුවට ඉදිරිපත් කර එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද බව, ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි හිටපු කළමනාකාර අධ්‍යක්ෂකට එරෙහිව	-එම-

	සැපයුම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවෙකු නොවූ මෙම සමාගම සැපයුම්කරු ලෙස තෝරාගත් අවස්ථාවලදී අදාළ ප්‍රසම්පාදන කමිටුවලට කළමනාකර අධ්‍යක්ෂකද සාමාජිකයෙකු වශයෙන් සහභාගී වී තිබුණි.	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂන කොමිෂන් සභාවේ පැමිණිල්ලක් සිදු කරන ලද අතර අදාළ සමාගම වෙත පවතින ගෙවීම් මේ වන විට අත්හිටුවා ඇති අතර එම ගෙවීම් සිදුකිරීම සම්බන්ධව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන නීති නිළධාරී වෙතින් උපදෙස් ලබා ගැනීමට යොමුකර ඇති බව.	
(ඇ)	ප්‍රමිතියෙන් තොර ප්ලාස්ටික් බෝතල් මිලදී ගැනීම හේතුවෙන් මූඩිය අසලින් ෂැම්පු කාන්දුවීම හා දියර ලබා ගැනීමට සකස් කර ඇති ආධාරකය ඉහලට එසවී තිබීම වැනි ගුණාත්මකභාවය පිළිබඳ දෝෂ හේතුවෙන් පිරිවැය රු.951,805ක්වූ පිළිවෙලින් මිලි ලීටර් 105 කෝමාරිකා ෂැම්පු බෝතල් 1,907ක් හා මිලි ලීටර් 95 කෝමාරිකා ෂැම්පු බෝතල් 395ක්ද මිලි ලීටර් 210 ක්වූ වෙනිවැල් බොඩිවොෂ් බෝතල් 95ක් හා මිලි ලීටර් 210 ක්වූ පංචවල්කල බොඩිවොෂ් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. ප්‍රමිතියෙන් තොර මෙම ප්ලාස්ටික් බෝතල් වලින් ඒකක 8,000ක සංඛ්‍යාවක් ගබඩාව තුළ පැවතියද, සැපයුම්කරු වෙත ලබා දීමට කටයුතු කර නොතිබුණි.	විගණන වාර්තාව හා එකඟ වන බව, මෙම සංස්ථාව මඟින් ලබාදුන් අච්චු (Mold) භාවිතාකර සිලෝන් නේචර් ආයුර්වේද (පුද්ගලික) සමාගම වෙතින් මෙම බෝතල් නිෂ්පාදනය කර ලබාගත් අතර බෝතල් මූඩිවල පැවති නිෂ්පාදන දෝෂ හේතුවෙන් ගැටලු මතුවූ බව, එම තත්ත්වය අදාළ සමාගමට දැනුම් දී අවස්ථා කිහිපයකදීම නිවැරදි කිරීම් සිදුකර භාවිතයට ගන්නා ලද බව, මේ වන විට එම බෝතල් භාවිතයට නොගන්නා අතර ඉතිරි තොග නැවත සැපයුම්කර වෙත යැවීමට ඇති හැකියාව සොයාබලා ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව.	පූර්ණ විමර්ශනයක් සිදුකර ඒ අනුව කටයුතු කළ යුතුය.

1.6.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත			
(i) 16(2) උප වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය අනුව හඳුන්වා දුන් රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ 6	මුදල් වර්ෂයක් අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට නියමිත දිනට වඩා දින 105 ක් ගත කර	සංස්ථාවේ පරිගණක දත්ත පද්ධතිය වෙනස් කිරීමත්, චෙක්පත් මඟින් සිදුකර ඇති මූල්‍ය වංචාවක් අනාවරණය කර ගැනීම සඳහා 2025 පෙබරවාරි මස සිට දත්ත පද්ධතිය හා ගෙවීම් වවුචර පරීක්ෂා කිරීමට කටයුතු කර ඇති බව, එම	පනතේ විධිවිධානවලට හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.

පරිච්ඡේදයේ 6.6 ඡේදය	තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2025 අගෝස්තු 21 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	හේතුවෙන් ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාදවී ඇති බව.	
(ii) 38(1) උපවගන්තියේ (ඇ) ඡේදය, 38(2) උප වගන්තිය හා 2022 ජුලි 29 දිනැති අංක DMA-02/2022 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය	මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලධායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, ඉටුකළ යුතු සමාලෝචනය ලිඛිතව සිදුකළ යුතු අතර එහි පිටපත් විගණකාධිපති වෙත ලබා දිය යුතු වුවත් ඒඅනුව කටයුතු කර නොතිබුණි. මූල්‍ය පාලනය සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර නොතිබීම මත 2024 හා 2025 වර්ෂයෙහි පිළිවෙලින් රු.16,915,307ක් හා රු.14,209,392ක මූල්‍ය වංචාවක් සිදුවී තිබුණි.	අවශ්‍ය වෙනස්කම් සමාලෝචනය කර මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති අතර දැනට භාවිතා කරනු ලබන 2006 වර්ෂයේදී පමණ ස්ථාපනය කර ඇති පරිගණක දත්ත පද්දතිය වෙනුවට නව ERP පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කටයුතු කරමින් පවතින බව.	-එම-
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
(i) මුදල් රෙගුලාසි 110	හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණුද එය නියමිත ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එය යාවත්කාලීනද කර නොතිබුණි.	නියමිත ආකෘතිය අනුව හානිපාඩු ලේඛනය සකස් කිරීමටත්, රුපියල් 38,000ක් වන මෝටර් රථයකට සිදු වූ හානියේ වටිනාකම නිවැරදිව ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) මුදල් රෙගුලාසි 166	මුදල් සමඟ ලැබෙන අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම සහ විධිමත් සටහන් තබා නොගැනීම හේතුවෙන් හඳුනාගැනීමට නොහැකි වූ වර්ෂ 01ත් 05ත් අතර බැංකු ගිණුම් 04ක රු.21,109,827ක් වටිනා	ගනුදෙනුකරුවන් සෘජුවම බැංකුව වෙත කරනු ලබන ගෙවීම් වලට අදාළ තොරතුරු අලෙවි අංශයට හෝ ගිණුම් අංශය වෙත ලබා නොදීම නිසා තැන්පතුකරු නිශ්චිතව හඳුනාගැනීමට නොහැකිවී ඇති	-එම-

	මුදල් තැන්පතු ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	බව, අදාළ තොරතුරු බැංකුව මගින් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව.	
(iii) මුදල් රෙගුලාසි 395 (ඇ)	එක් එක් මාසයේ ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත්, බැංකු ජංගම ගිණුම් 05ක් සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	සංස්ථාවේ බැංකු සැසඳුම පරිගණක මෘදුකාංගය මගින් සිදු කරන අතර ඒ සඳහා බැංකු ගනුදෙනු සියල්ලට අදාළ දත්ත යාවත්කාලින කලයුතු බව, ඊට අදාළ තොරතුරු/මූලාශ්‍ර ලේඛන ලැබීම ප්‍රමාදයන් නිසා බැංකු සැසඳුම් පිළියෙළ කිරීම නියමිත දිනට සිදු කර නොමැති අවස්ථා පවතින බව, නව ERP පද්ධතිය ස්ථාපනය කළ පසුව මෙම ගැටළු මගහරවාගත හැකි වනු බව.	-එම-

1.6.5 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ලංකා බැංකු ජංගම ගිණුමේ රු.895,000ක ශේෂයක් 2023 අප්‍රේල් මස සිට නිෂ්කාර්යව පවතින අතර මෙම ජංගම ගිණුම පවත්වාගෙන යැමේ අරමුණ කුමක්ද යන්න පිළිබඳව ලිඛිත සාක්ෂි කිසිවක් සමාලෝචිත වර්ෂයේදීද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණ සහ උපදෙස් පරිදි ලංකා බැංකුවේ ගිණුම ආරම්භ කර ඇති බව, මෙම ගිණුම තවදුරටත් පවත්වාගෙනයාමේ අවශ්‍යතාවය පිළිබඳව නැවත සමාලෝචනය කර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලබන බව.	සංස්ථාවේ එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේදී මුදල් ප්‍රවාහයන් තාර්කිකව හා විචක්ෂණශීලීව කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 182.92ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 218.08 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 35.16 ක පිරිහීමක් නිරීක්ෂණය විය. විකුණුම් ආදායමට අනුරූපව විකුණුම් පිරිවැය වැඩිවීම, ආයතන හා පරිපාලන වියදම්, විකුණුම් හා බෙදාහැරීමේ වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 25.05 කින් වැඩිවී තිබුණු නමුත් විකුණුම් පිරිවැයද සියයට 41.87 කින් හා ආයතන හා පරිපාලන වියදම් රු.මිලියන 16.35 කින් වැඩිවීම නිසා මෙහෙයුම් කටයුතු වලින් රු.මිලියන 182.92ක අතිරික්තයක් ලබා තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 2.64 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 16.12 කින් අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සංස්ථාව විසින් අඛණ්ඩව විධිමත් අනුමැතියකින් තොරව රු. මිලියන 15 ඉක්මවා වැඩිවන මාසික නිෂ්පාදන පිරිවැය මත පදනම්ව සංස්ථාවේ සියළුම අංශවල සේවකයන්ට මාසිකව රු.මිලියන 02 ත් රු.මිලියන 06 ත් අතර මුදලක් නිෂ්පාදන දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණි. ඉකුත් වර්ෂයේ රු.82,453,412 ක් වූ මෙම දිරිදීමනා වියදම සමාලෝචිත වර්ෂයේදී රු.65,985,733 ක් විය. එසේ වුවද, අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන නිෂ්පාදනය කරනු ලබන බොහෝ නිෂ්පාදනයන් ගබඩාව තුළදීම හෝ අලෙවි සැල්තුළ කල් ඉකුත් වීමට ලක්වන අතර 2022 හා 2023 වර්ෂයන්හි එසේ කල් ඉකුත්වූ හා හානිවූ තොග වටිනාකම පිළිවෙලින් රු.12,885,943ක් හා රු.6,996,583ක් විය. ගුණාත්මකභාවය පිළිබඳ දෝෂ හේතුවෙන් ගබඩා වෙත 2023 හා 2024 වර්ෂයන්හි ආපසු භාරදෙන නිෂ්පාදනයන්හි වටිනාකම රු.2,573,644ක් විය. මේ අනුව, නිෂ්පාදන දිරි දීමනා ගෙවීමේදී සංස්ථාවට ආදායම් උපයාගත නොහැකිවූ ගුණාත්මකභාවය පිළිබඳ දෝෂයන් හා කල් ඉකුත්වූ නිෂ්පාදනයන් සඳහාද දිරි දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි.	මෙම සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව නිෂ්පාදන දිරිදීමනා ක්‍රමයක් දිගුකලක් තිස්සේ ක්‍රියාත්මක වන අතර එම දිරිදීමනාව සමස්ථ කාර්යමණ්ඩලයටම අදාළ වන පරිදි ගෙවීම් කරනු ලබන බව, නව සේවක දිරිදීමනා ක්‍රමයක් කෙටුම්පත් කර අමාත්‍යාංශ නිර්දේශය ද සහිතව මහා භාණ්ඩාගාරය වෙත යොමුකර ඇතත් මේ දක්වා අනුමැතිය ලබාදී නොමැති බව, මෙම නිෂ්පාදන දිරිදීමනාව ගෙවීමේදී පාදක කර ගන්නා මාසික නිෂ්පාදන වටිනාකම 2021 වර්ෂයේදී පැවති නිෂ්පාදන පිරිවැය පදනම්කරගෙන ගණනය කර ඒ අනුව දිරිදීමනාව ගෙවීම්කරන බව.	විවිධ කාර්යසාධනයන් සහිත අංශ ඒ අනුව ඇගයීම වෙනුවට නිෂ්පාදන කටයුතු සඳහා ඍජු දායකත්වයක් සපයන සේවකයින් සඳහා යෙදාගන්නා නිෂ්පාදන පිරිවැය මතම සියලුම අංශ ඇගැයීම නුසුදුසු වන අතර අදාළ නිෂ්පාදන ඒකක ප්‍රමාණයේ වැඩිවීම් මත ගණනය කරන දිරි දීමනාවක් නිෂ්පාදන අංශයට පමණක් හා වෙනත් කාර්යසාධන මත ගණනය කරන දිරි දීමනාවක් සෙසු අංශවලට හඳුන්වා දීමට පියවර ගෙන ආයතනයේ ඵලදායිතාවය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව, සංස්ථාවේ අරමුණු 07 අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි	මෙම සංස්ථාවේ සංස්ථාපිත අරමුණුවල ඇතුළත් ඖෂධ නිෂ්පාදනය සඳහා වන එලගිතෙල් නිපදවීම හා එළකිරි ලබා ගැනීමට ගවපට්ටි පවත්වාගෙන යාමත්, මීපැණි ලබා ගැනීමට මීමැස්සන් ඇති	සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හෝ ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල වන සේ අරමුණු සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය.

	පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීමට මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි	කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස ආරම්භ කිරීම සම්බන්ධව අවස්ථා කිහිපයකදී සාකච්ඡාවන් සිදුකර ඇතත් ව්‍යාපෘතිය ආරම්භ කර නොමැති බව.	
(ආ)	සමාලෝචිත වර්ෂයේ වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව නිෂ්පාදනයන් 13කට අදාළව නිෂ්පාදන ඒකක 1,505,478ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, නිමකළ තථ්‍ය ඒකක ප්‍රමාණය 527,249ක් වූයෙන් ඒකක 978,229ක ප්‍රමාණයක් එනම් සියයට 65ක් නිමකර ගැනීමට නොහැකිවී තිබුණි.	2024 වර්ෂය සඳහා සැලසුම්ගත වැඩපත් සංඛ්‍යාව 3007ක් බව, නිමකළ තථ්‍ය වැඩපත් සංඛ්‍යාව 1672ක් බව, කාලීනව ලබාගන්නා අමුද්‍රව්‍ය හිඟය, අමුද්‍රව්‍ය මිල උච්ඡාවචනයන් හේතුවෙන් සැපයුම් කටයුතු අඩාල වීම ආදී හේතුන් මත ඉලක්කගත නිෂ්පාදනය ලගාකරගැනිමට නොහැකි වූවද 2024 වර්ෂයේදී මුළු නිෂ්පාදන වටිනාකම රුපියල් මිලියන 606.347 ක ප්‍රශස්ත මට්ටමේ ඉලක්ක ළඟා කර ගත් බව.	නිෂ්පාදන ඉලක්ක සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.
(ඇ)	සංස්ථාව විසින් පිළියෙල කර තිබුණු නිෂ්පාදන හා අලෙවි සැලැස්මට අනුව කටයුතු ඉටුකරන සංස්ථාවේ විවිධ අංශවල ක්‍රියාවලීන්හි කාර්යයන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි.	විගණන වාර්තාව හා එකඟ වන බව, වාර්ෂිකව නිෂ්පාදන සැලසුම හා අලෙවි සැලැස්ම සකස් කිරීමත්, ඒ අනුව මෙහෙයුම් කටයුතු සිදු කිරීමත් ප්‍රගති සමාලෝචනය කිරීමත් සිදු කරන බව, මාසිකව ප්‍රගතිය සමාලෝචන වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කලද, ආංශික ක්‍රියාවලින්හි කාර්යන් ඇගයීම සඳහා කාර්යසාධන දර්ශන පිහිටුවා එම කාර්යන් සමාලෝචනය කිරීමට පියවර ගෙන නොමැති බව, 2026-2030 කාල පරිච්ඡේදයට අදාළ ආයතනික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී මේ පිළිබදව විශේෂ අවධානය යොමුකර කටයුතු කරනු ලබන බව.	සංස්ථාවේ එක් එක් අංශවල, ක්‍රියාවලිවල කාර්යසාධනය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා එම කාර්යයන්හි කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය.
(ඈ)	සංස්ථාවේ සමස්ථ විකුණුම් ආදායම් ඇස්තමේන්තුව රු.1,862,515,000 ක්වූ අතර තත්‍ය ආදායම රු.1,519,775,447ක්	නව වෙළඳපලට ගැලපෙන ආකාරයෙන් ඩිජිටල් අලෙවිකරණ ක්‍රමවේද 2024	පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ විකුණුම් ආදායම වර්ධනය කර

	විය. තත්‍ය ආදායමෙන් සියයට 81 ක් රාජ්‍ය අංශයෙන් හා සියයට 19ක් පෞද්ගලික අංශයෙන් ලැබී තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී පෞද්ගලික අංශයේ අලෙවි ආදායම සියයට 26 සිට සියයට 19 දක්වා අඩුවී තිබුණි. වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා නොගැනීමත්, වෙළඳ පොළ මිලට සාපේක්ෂව විකුණුම් මිල වැඩිවීම, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා නොකිරීම, විකුණුම් අදායම අඩුවීමට හේතුවී තිබුණු අතර වෙළඳ පොළ මිලට සාපේක්ෂව ඉහල විකුණුම් මිලකට රාජ්‍ය අංශයට අලෙවි කිරිම තුළින් සංස්ථාව අයුතු ලෙස ආදායම් උපයා තිබුණි. තවද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව මිල කැඳවීමකින් තොරව රාජ්‍ය අංශය විසින් ඍජුව සංස්ථාව වෙතින් පමණක් ඖෂධ මිලදී ගනු ලබන බවත් කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි බවත් විගණනයේදී නිරීක්ෂණය විය.	වර්ෂය තුල ආරම්භ කර ඇති බව, අලෙවි මුළු ආදායමින් රාජ්‍ය අංශයේ සහභාගය සියයට 75 ඉක්මවන බැවින් අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු තත්ත්වයක් පවතින බව, මෙම සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන ආයුර්වේද ඖෂධ හා ශාකසාර නිෂ්පාදන අදාළ වට්ටෝරු අනුව සියලුම ඖෂධ අමුද්‍රව්‍ය යොදා නිසි ප්‍රමිතියට වෛද්‍යවරුන්ගේ සුපරීක්ෂණය හා තත්ත්ව පාලනය යටතේ සිදුකරන බව, තරඟකාරී ඉහල ප්‍රමිතිය පවත්වාගෙන යන ආයතනවල මිල ගණන් අපගේ මිලගණන් සමග සසඳන විට සම මට්ටමක පවතින බව, නමුත් වෙළඳපල පවතින ඇතැම් ආයතනවල මිල ගණන් අඩු අගයක් ගන්නා අතර ඒවායේ ප්‍රමිතිය පිළිබඳව සහතික විය නොහැකි බව, සාපේක්ෂව ඉහල මිලකට අලෙවි කිරීම තුලින් සංස්ථාව අයුතු ලාභයක් උපයා ඇති බවට සිදුකර ඇති නිරීක්ෂණය බැහැර කරන බව, කෙසේ නමුත් සමස්ථ වෙළඳපල ඉලක්කගතකර ගෙන රාජ්‍ය හා පුද්ගලික අංශයේ අලෙවි වර්ධනය කිරීමට හා නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමට කටයුතු කරනු ලබන බව .	ගැනීමට වෙළඳ පොළ අවශ්‍යතා නිසිපරිදි හඳුනා ගැනීමටත්, නව ප්‍රචාරණ හා අලෙවි ප්‍රවර්ධන ක්‍රම උපායන් භාවිතා කිරීමටත් කටයුතු කළ යුතුය.
(ඉ)	නව නිෂ්පාදනයක් වෙළඳසලට හඳුන්වා දීමට ප්‍රථම සාම්පල නිෂ්පාදනයක් සිදු කර එහි ප්‍රමිතිය පිළිබඳව තත්ත්ව සහතිකයක් ලබා ගැනීමෙන් පසු නිෂ්පාදන ක්‍රියාවලියට පිවිසිය යුතු වුවත්, තත්ත්ව පරික්ෂාවකින් තොරව නිෂ්පාදිත සැන්ඩල්වුඩ් ෆේෂ් වොෂ් දෝෂ සහිත බැවින් පිරිවැය රු.984,045ක්වූ පිළිවෙළින් මිලි ලිටර් 100 බෝතල් 4,504ක් හා මිලි ලිටර් 50 බෝතල් 424ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණු අතර සංස්ථාව	මෙහි අන්තර්ගත දත්තය සමග එකග වන බව, දැනට මෙම සුදු හඳුන් නිෂ්පාදනයන්හි කොටසක් දෝෂ නිරාකරණය කර ඇති බව, මෙවැනි තත්ත්වයන් නැවත වාර්තා නොවීමටත් ශක්තිමත් නව නිෂ්පාදන වෙළඳපලට හඳුන්වා දීම සඳහා තාක්ෂණික කමිටුවක් ITI ආයතනයේ ආයුර්වේද පර්යේෂණ	නව නිෂ්පාදනයක් වෙළඳපලට හඳුන්වා දීමට ප්‍රථම සාම්පල නිෂ්පාදනයක් සිදු කර එහි ප්‍රමිතිය පිළිබඳව තත්ත්ව සහතිකයක් ලබා ගැනීමෙන් පසු නිෂ්පාදන ක්‍රියාවලියට පිවිසීමට කටයුතු කළ යුතුය.

සතුව එම දෝෂ නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් මෙම නිෂ්පාදනය නවතා දැමීමට කටයුතු කර තිබුණි. එසේවුවද, මෙම නිෂ්පාදනය හේතුවෙන් සංස්ථාවට සිදු වී ඇති අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ආයතනය, සංස්ථා වෛද්‍යවරුන් හා පර්යේෂණ හා සංවර්ධන අංශයේ තත්ත්ව පාලන කළමනාකරු හා එක්ව පිහිටුවා ඉදිරි කටයුතු මේවන විට සිදු කරනු ලබන බව .	

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පතිරගොඩ නිෂ්පාදනාගාරයට රු.9,095,322 ක් වටිනා 150 KVA විදුලි ජනන යන්ත්‍රයක් මිලදී ගෙන ස්ථාපිත කර තිබුණද, විදුලි ජනන යන්ත්‍රය ප්‍රධාන පරිපථයට සම්බන්ධ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සංස්ථාව විසින් නොගැනීම හේතුවෙන් වර්ෂයකට අධික කාලයක් නිෂ්පාදනාගාරය තුළ නිෂ්කාර්යව පැවතුණි. යන්ත්‍රය සඳහා වසරක වගකීම් සහතිකයක් තිබුණද වගකීම් කාල සීමාව ඵලදායිව උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණු අතර ඉදිරි වසර 06කට අදාළව දක්වා ඇති නඩත්තු පිරිවැය රේටයන් යටතේ නඩත්තු කටයුතු සිදු කර ගැනීමට විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.	විගණන වාර්තාව හා එකඟ වන බව, අදාළ ස්විචය හා උපකරණ වලට අදාළ පිරිවිතර සකස් කිරීමට හා තාක්ෂණික නිර්දේශ ලබා ගැනීමට බාහිර ආයතනවලින් සේවය ලබාගැනීමේදී කල්ගතවීම නිසා මෙම අනපේක්ෂිත ප්‍රමාදය සිදුවී ඇති බවත්, මේවන විට විදුලි ජනන යන්ත්‍රය ප්‍රධාන විදුලි පරිපථයට සම්බන්ධ කිරීමට අවශ්‍ය ස්විචය හා උපකරණ පද්ධතිය ස්ථාපිත කර එය ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කර ඇති බව.	වත්කම් ඵලදායිව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සංස්ථාවේ සෑම අංශයක්ම ආවරණය වන ආකාරයට ඒකාබද්ධ පරිගණක මෘදුකාංග පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා රු.30,000,000ක මුළු මුදලක් වර්ෂ 05ක කාලයක් සඳහා මාසික රු.500,000 බැගින් ගෙවීමේ ක්‍රමවේදයක් තුලින් පුද්ගලික සමාගමක් වෙත ලංසුව පිරිනමා තිබුණි. මෙහිදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ලංසු ලේඛන ප්‍රකාරව මෙම පද්ධතිය සති 28ක කාලයක් තුළ ස්ථාපිත කළයුතු වුවත් මාස 02ක කාල ප්‍රමාදයක් දක්නට වූ අතර විධිමත් ලිඛිත ගිවිසුමකට නොඑළඹීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. පරිගණක මෘදුකාංග පද්ධති ස්ථාපිත කර සේවක පුහුණු කිරීම ලබා දී තිබියදී	ERP මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට අනුබද්ධිත ආයතනයක් වෙත 2024 ජනවාරි 19 දින ප්‍රසම්පාදන පිරිනැමීක් සිදු කරන ලද බව, ගිවිසුමේ සඳහන් ආකාරයට ERP මෘදුකාංග පද්ධතිය සංවර්ධනය කර මෙම සංස්ථාව තුල ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමෙන් පසු මසකට රුපියල් ලක්ෂ 5 බැගින් වසර 5 ක කාලයක් සඳහා ගිවිසුම්ගතව ඇති බව, මේවන විට මෘදුකාංග සංවර්ධන කටයුතු අවසන් කර ඇති බව, ඒ අනුව කාර්ය මණ්ඩලය වෙත ප්‍රායෝගික පුහුණුවීම් සිදුකර ඇති අතර ඉතාම කඩිනමින් ERP පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන බව.	-එම-

සංස්ථාව විසින් ආරම්භක ශේෂයන් එම පද්ධතියට ඇතුළත් කිරීමට හා කටයුතු කර නොතිබීමෙන් විගණිත දිනයවූ 2025 අගෝස්තු දක්වා එනම් මාස 09කට ආසන්න කාලයක් එම පද්ධතිය හා මෙම ERP පරිගණක මෘදුකාංග පද්ධතිය ක්‍රියාත්මක කිරීමට මිලදී ගන්නා ලද රු.6,307,151ක් වටිනා පරිගණක හා අනෙකුත් උපාංග ඒකක 79ක් නිශ්කාර්යව පැවතුණි.		

3.4 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017, 2018, 2020 හා 2021 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.102,000,000 කින් රු.26,149,834 ක් හෙවත් සියයට 26 ක් 2025 ජුනි 30 දින වන විටත් උපයෝජනය නොකර බැංකු ගිණුමක රඳවා ගෙන තිබුණි.	විගණන වාර්තාව හා එකඟ වන බව, ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදනවලට අදාළ ව්‍යාපෘති සම්පූර්ණ නොවීම හේතුවෙන් එම මුදල් බැංකු ගිණුමක පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව, පසුගිය කොවිඩ් වසංගත තත්ත්වය හා පරිපාලනමය ගැටළු කිහිපයක් හේතුවෙන් රස ඖෂධ නිෂ්පාදනාගාර ගොඩනැගිල්ලේ කටයුතු ප්‍රමාද වූ අතර එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇති බව.	සංස්ථාවේ අරමුණු ඉටුකර ගනිමින් රටේ සංවර්ධනයට දායක විය හැකි අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ ව්‍යාපෘති පමණක් සැලසුම් කර එම සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පමණක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගත යුතු අතර ඉතිරිව පවතින ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ ව්‍යාපෘති නැවත සමාලෝචනය කර අත්‍යවශ්‍ය කාර්යයන් කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂය සඳහා රු.12,430,560 ක් වටිනා ටර්පන්ටයින් කිලෝග්‍රෑම් 8,930ක් මිලදී ගැනීමේදී මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2, 7.12.1 හා 8.9.1(ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද, ගිවිසුම්ගත නොවීම මත කිලෝග්‍රෑම් 150ක් දින 18ක කාල ප්‍රමාදයකින් පසුව සපයා තිබුණු හා කිලෝග්‍රෑම් 150ක් නොසපයා සති 14ක කාලයක් ගතවී තිබුණද ප්‍රමාද ගාස්තු අයකරවා ගැනීමට නොහැකිවී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මිලදී	තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සහිතව DPC-1-24/01/13 ප්‍රසම්පාදන තීරණය අනුව Colombo Commercials ආයතනය වෙත පිරි නමා ඇති බව, ප්‍රසම්පාදන තීරණය අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමට ප්‍රථම එම ප්‍රමාදය සම්බන්ධ නිෂ්පාදන කටයුතු සඳහා යම් අලාභයක් සිදුවී ඇත්ද යන්න නිර්දේශය ලබා ගෙන ප්‍රමාද ගාස්තු අය කිරීමට අනුමැතිය ලබාදී ඇති බව, ඒ අනුව අදාළ ගබඩාව භාර වෛද්‍ය නිළධාරීගේ	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව හා ප්‍රමාද ගාස්තු අයකරවා ගැනීම වැනි කොන්දේසි ඇතුළත්ව ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමට කටයුතු කළ යුතුය.

	ගැනීම කිලෝග්‍රෑම් 6,811ක් වුයෙන් අවශ්‍යතාවය නිසිපරිදි හඳුනා ගැනීමෙන් තොරව වාර්ෂික සැලසුම් සකස් කර තිබුණි.	නිර්දේශය මත ප්‍රමාද ගාස්තු අය කිරීම් සිදු කර නොමැති බව.	
(ආ)	2024 වර්ෂය සඳහා රු.33,715,000ක් වටිනා එළගි තෙල් කිලෝග්‍රෑම් 12,260ක් ජාතික තරඟකාරි ක්‍රමය යටතේ මිලදී ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළ කර තිබුණද, කිසිදු ලංසුකරුවෙකු ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණු බව දක්වමින්, එළගි තෙල් කිලෝග්‍රෑම් 6,991ක් මිලදී ගැනීම සඳහා දින 07ක් තුළ ලියාපදිංචි හා විවෘත වෙළඳපල තුළින් විද්‍යුත් තැපැල මගින් මිල කැඳවීමට 2024 ජනවාරි 10 දින අනුමැතිය ලබාදී තිබුණි. 2024 ජනවාරි 17 දින විද්‍යුත් තැපැල මගින් එළගි තෙල් සපයන ප්‍රධාන ආයතන විශාල සංඛ්‍යාවක් පැවතියද, එම ආයතන වෙතින් මිල කැඳවීම් සිදු නොකර, තෝරාගන්නා ලද සැපයුම්කරු හා වෙනත් ආයතන වෙතින් මිල කැඳවීම් සිදු කර තිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ), 5.4.10(ඇ) , 6.2.2, 6.3.6, 7.8.4, 8.9.1(ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කිසිදු ලංසුකරුවෙකු මිල ගණන් ලබා නොදී ඇති බැවින් නැවත ප්‍රසම්පාදන තීරණය අනුව ලියාපදිංචි හා විවෘත වෙළඳපල ආයතන මඟින් විද්‍යුත් තැපැල මඟින් මිල කැඳවීම් සිදු කරන ලද බව, ඉදිරිපත් වූ මිල ගණන් නියැදි වාර්තා හා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය සහිතව ප්‍රසම්පාදන තීරණය අනුව මෙම ආයතනය වෙත පිරි නමා ඇති බව, පෙර වර්ෂවල සිට අප ආයතනයට පැලවත්ත හා මිල්කෝ ආයතනය එළඟි තෙල් සැපයුම් කරන ලද අතර, අප විසින් ඉල්ලුම් කරන ලද ප්‍රමාණ නියමිත කාලයට නියමිත ප්‍රමිතීන් අනුව සැපයීම් සිදු කර ඇති බව.	-එම-
(ඇ)	නියැදි පරික්ෂණ වාර්තාවේ මීතෙල්වල ඇසිට් අගය අන්තර්ජාතික ප්‍රමිතවල සඳහන් කර ඇති ප්‍රමාණයට වඩා වැඩි අගයක්වීම හේතුවෙන් නියැදි පරික්ෂණයන් අසමත් වුවත්, සංස්ථාවේ වෛද්‍ය කමිටුව විසින් නිෂ්පාදන කටයුතු සඳහා සුදුසු බව නිර්දේශ කිරීම හේතුවෙන් නියැදි පරික්ෂණයන් අසමත්වූ සැපයුම්කරුගෙන් අඛණ්ඩව රු.2,484,531ක් වටිනා මීතෙල් කිලෝග්‍රෑම් 2,208ක් මිලදී ගෙන තිබුණි. ඇණවුමේ සඳහන් දිනෙන් පසුව භාණ්ඩ සැපයීමේදී, සැපයුම් කාලය ඉක්මවූ සෑම සතියක් හෝ කොටසකට සියයට 1ක් හා දෙවන සතිය සඳහා සියයට 2ක් වනසේ ප්‍රමාද ගාස්තු අයකළ යුතු අතර දෙවන සතිය අවසන්වූ වහා ගිවිසුම අවලංගු කළ යුතු බව මිල කැඳවීම් ලිපියෙහි සඳහන්	සංස්ථාව විසින් භාවිතා කරන පිලිගත් ප්‍රමිතීන්හි කුඩා ප්‍රමාණයේ වෙනසක් පැවතුනහොත්, රසායනාගාරය හා වෛද්‍යවරුන් සාකච්ඡා කර එකඟතාවයකට පත් විය හැකි අවස්ථා වලදී පමණක් එකඟතාවය මත මිලදී ගැනීමක් සිදු කරනු ලබන බවත්, ප්‍රසම්පාදන තීරණය අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමට ප්‍රථම එම ප්‍රමාදය සම්බන්ධ නිෂ්පාදන කටයුතු සඳහා යම් අලාභයක් සිදුවී ඇත්ද යන්න සලකා බලා අදාළ ගබඩාව භාර වෛද්‍ය නිළධාරීගේ නිර්දේශය මත ප්‍රමාද ගාස්තු අය කරන බව.	පිළිගත් ප්‍රමිතීන්ට පටහැනිව නියැදි පරික්ෂණයන් අසමත් මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු නොකළ යුතු අතර ප්‍රමාද ගස්තු අයකරවා ගැනීම වැනි කොන්දේසි ඇතුළත්ව ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමට කටයුතු කළ යුතුය.

වුවත් ගිවිසුම අවලංගු කිරිමෙන් තොරව කාල ප්‍රමාදය නොසලකා සියයට 2ක ප්‍රමාද ගාස්තු අයකර තිබුණි. තවද, ගැණුම් ඇණවුම සඳහා ගබඩාවට භාණ්ඩ ලැබීමට පෙර ඊළඟ ගැණුම් ඇණවුම නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රෝගීන්ගේ රස බෙහෙත් අවශ්‍යතාවය සපුරාලීමේ හා නිරෝගී සමාජයක් ගොඩ නැගීමේ අරමුණින් රු.45,725,759 ඇස්තමේන්තු පිරිවැයක් සහිත රස බෙහෙත් නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය රු. 37,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබුණි. 2020 ජනවාරි 02 දක්වා රු.12,144,400 ක් වැය කර ඉදිකිරීම්වලින් සියයට 30 ක් නිමකර තිබුණද සැලසුම් හා අධීක්ෂණ දුර්වලතා හේතුවෙන් එදින සිට ඉදිකිරීම් තාවකාලිකව නතර කර තිබුණි. 2025 ජුනි 30 වන විට වසර 06 ක් ඉක්මවා තිබුණු මෙම ව්‍යාපෘතියේ අදාළ ඉදිකිරීම් නැවත ආරම්භ කර නොතිබුණි.	විගණන වාර්තාව හා එකග වන බව, මේවන විට නැවත වතාවක් මූලික සැලසුම අනුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ආවධානය යොමුකර සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉංජිනේරු) වෙතින්ද වැඩිදුරටත් උපදෙස් ලබාගන්නා ලද බව, ඒ අනුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ඉදිරිපත් කර ඇති නව ඇස්තමේන්තුව යටතේ ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදී ඇති බව, ඒ අනුව කොන්ත්‍රාත්කරු සමග වැඩිදුරටත් සාකච්ඡාකර ඉදිරි කටයුතු කඩිනමින් සිදුකිරීමට නියමිතව ඇති බව.	ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 375ක් වූවද එදිනට තත්‍ය කාර්යමණ්ඩලය 328ක් වූයෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 13කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 51 ක් විය. ඒ අනුව පිළිවෙලින් කළමනාකරණ ,සහකාර, ප්‍රාථමික මට්ටමේ තනතුරු 17 ක්, 06 ක් හා 28 ක පුරප්පාඩු පැවතීම සංස්ථාවේ කාර්ය සාධනය කෙරෙහි බලපෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.	විගණන වාර්තාව හා එකග වන බව, කළමනාකරණ මට්ටමේ තනතුරු වලින් කෘෂිකර්ම නිළධාරී බදවා ගැනීමට කටයුතු කර ඇති අතර, කළමනාරු (සැපයුම්) හා පරිගණක දත්ත නිළධාරී 2025 අගෝස්තු සිට බඳවා ගැනීමට නියමිතව ඇත. අනෙකුත් තනතුරු කිහිපයකට අදාලව අයදුම්පත්‍ර කැදවා ඇති අතර ප්‍රාථමික මට්ටමේ තනතුරු වලට බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇති අතර අනුමැතිය ලැබීමෙන් පසු ඉතා කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කරනු ලබන බව.	සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය වර්තමානයට ගැලපෙන සේ සමාලෝචනය කර බඳවා ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‘‘න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සංස්ථාව තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ප්‍රමාණවත්ව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී මෙම ඉලක්ක පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් නොමැති බවත් ඉදිරි වර්ෂයේදී මේ සම්බන්ධව ප්‍රතිපත්ති ඇතුළත් කිරීම හා ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලබන බව.	තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.